# පණ්ස්හයේ දරුවෝ

1989 සැප්තැම්බර් 26 වැනි දින පළමුවැනි බණ්ඩාරණායක අනුස්මරණ දේශනය පැවැත්වීමේ භාග්‍යය උදාවුයේ මට ය. ඒ සඳහා මා තෝරා ගනු ලැබුවාට වඩා අහම්බයකින් මට ඒ අවස්ථාව හිමි විණි යැයි පැවසීම නිවැරදි ය. ඒ බව අදාළ සමරු කමිටුවේ සභාපති මහින්ද රාජපක්ෂ මහතා මෙන් ම එවකට ශ්‍රී ල නි පක්ෂයට කිට්ටු වී සිටි වික්ටර් අයිවන් මහතා හා ජේ. ආර්. පී සූරියප්පෙරුම මහතා ද දනිති. ඒ දේශනයෙහි මාතෘකාව ලෙස මා තෝරා ගත්තේ පණ්ස්හයේ දරුවෝ යන්න ය. ඉන් වසර දහහතරකුත් මාස හතරකට පසු ඒ දේශනය පැවැත් වූ ශාලාවේ දී ම පණ්ස්හයේ දරුවෝ සන්ධානයකට ඇතුළත් වූහ. පසුගිය අවුරුදු දහහතරක දේශපාලන ගමන් මග හොඳින් ම විස්තර කිරීමේ හැකියාව ඇත්තේ ජාතික චින්තන මතවාදවලට වීම නම් අහම්බයක් විය නොහැකි ය.

මේ ලිපියෙහි සඳහන් වන්නේ අවුරුදු දහතරකට පෙර කරන ලද කතාවෙහි වර්ධනයකි. පණ්ස්හයේ දරුවෝ යනු පණ්ස්හයෙන් ආශ්වාදයක් හා ආභාසයක් ලැබූ එකල, එනම් පණ්ස්හයේ දී, කුඩා වියේ සිටියවුවෝ ද ඉන් පසුව උපන් අය ද වෙති. ඔවුන් අද ශ්‍රී ල නි පක්ෂයේ ද, ජනතා විමුක්ති පෙරමුණේ ද, මහජන එක්සත් පෙරමුණේ ද, සිහල උරුමයේ ද, භූමි පුත්‍ර පක්ෂයේ ද (නිර්වචනය අනුව හරිශ්චන්ද්‍ර විජේතුංග මහතා පණ්ස්හයේ දරුවෙක් නොවේ. ඒ මහතා පණ්ස්හයේ කොටස් කරුවෙකි.) වෙනත් කණ්ඩායම්වල ද, තනි තනි ව ද දැක ගත හැකි ය. දළ වශයෙන් ගතහොත් අද වන විට පණ්ස්හයේ දරුවෝ අවුරුදු හැටට අඩු අය වෙති. සුනේත්‍රා බණ්ඩාරණායක මෙනෙවිය ද මේ වයස් කාණ්ඩයේ වුව ද, ඇය බණ්ඩාරණායක මහත්ම මහත්මීන්ගේ දරුවකු වුව ද පණ්ස්හයේ දරුවෙක් නොවේ. ඇයට පණ්ස්හයේ ආභාසයක් නැත. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඉතා අමාරුවෙන් පසු දිනෙක පණ්ස්හයේ දරුවන්ගේ ගොඩට දමාගත හැකි වේ යැයි සිතමි. දිනේෂ් ගුණවර්ධන මහතා කිසිම පැකිලීමකින් තොරව පණ්ස්හයේ දරුවකු ලෙස හැඳින්විය හැකි ය. මා කුඩා කල සිට ම දන්නා හඳුනන තිලක් කරුණාරත්න මහතා ද පණ්ස්හයේ දරුවෙකි. සෝමවංශ අමරසිංහ මහතා මෙන් ම විමල් වීරවංශ මහතා ද අද පණ්ස්හයේ දරුවෝ වෙති.

එහෙත් අවුරුදු දහහතරකට පෙර අමරසිංහ මහතා මෙන් ම විමල් වීරවංශ මහතා ද වෙනත් ආකාරයක පණ්ස්හයේ දරුවෝ වූහ. ඔවුහු එදා එක්දහස් නවසිය පණ්ස්හයේ නොව ටී පණ්ස්හයේ දරුවෝ වූහ. ඒ බව මගේ දේශනයෙහි දී ද මම සඳහන් කෙළෙමි. (වාසනාවකට පටිගත කළ මේ කතාවේ පිටපතක් ඉතිරි වී ඇත.) එකල ද කිහිප වතාවක් ම මට අමරසිංහ මහතා හමු වී ඇත. මේ කතාව පවත්වන දිනයේ රෝහණ විජේවීර මහතා ජීවතුන් අතර සිටි මුත් ඉන් සති කිහිපයකට පසු ඔහු ඝාතනය කෙරිණි. ටී පණ්ස්හයේ දරුවන් ගැන මා කතා කෙළේ භීෂණය තදින් ම පැවති කාලයක ය. ඔවුන් නැවතත් පණ්ස්හයේ දරුවන් බවට පත්කර ගත යුතු යැයි මම ඒ කතාවෙහි දී සඳහන් කෙළෙමි. එකල ඔවුන්ට තිබුණේ අරගලයෙන් බලයට පත්වීමේ බලාපොරොත්තු ව ය. ආණ්ඩුවට තිබුණේ ඔවුන් සමූලඝාතනය කිරීමේ අවශ්‍යතාවය ය. ඔවුන් පණ්ස්හයේ දරුවන් බවට පත්කර ගත යුතු යැයි එකල කීම බොහෝ දෙනාට හතර බීරි කතාවක් විය. කෙසේ වෙතත් අද එය සඵල වී ඇත. එහෙත් තවමත් ගමන ආරම්භ කළා පමණකි. යා යුතු දුර බොහෝ වෙයි. එහෙත් ඒ ගමන යා යුතු ය.

පණ්ස්හය යනු අන් කිසිවක් නොව බටහිර ක්‍රිස්තියානි ආර්ථික, දේශපාලන හා සංස්කෘතික යටත්විජිතවාදයට එරෙහි ව අවුරුදු හාරසිය අනූනවයකට ආසන්න කාලයක් තිස්සේ අප ගෙන යන නිදහස් සටනෙහි බිංදු මාත්‍රයක් පමණකි. මෙය ගුණදාස අමරසේකර මහතා (ඒ මහතා ද පණ්ස්හයේ දරුවකු නොව එයට සම්මාදම් වූ අයෙකි.) පණ්ස්හය ගැන ඉදිරිපත් කර ඇති මතයක් වර්ධනය කර ප්‍රවාදයක කොටසක් බවට පත්කර ගැනීමකි. මේ පිළිබඳ ව අමරසේකර මහතාට දිය යුතු ගෞරවය මා කතාවේ ද දී ඇත. ඒ මහතාට අනුව පණ්ස්හය යනු යටපත් වූ අනගාරික ධර්මපාල ව්‍යාපාරය නැවතත් මතු වීමකි.
පාප් වහන්සේ ලෝකය ඉරකින් බෙදා වෙන්කර ස්පාඤ්ඤයන්ට හා පෘතුගීසීන්ට ලියා දීමෙන් පසුව දළ වශයෙන් ගත් කල පෘතුගීසීහු ආසියාවට හා අප්‍රිකාවටත් ස්පාඤ්ඤයෝ ඇමරිකාවටත් ගියහ. ඔවුහු එක් අතෙකින් කඩුවත්, අනෙක් අතින් බයිබලයත් ගෙන වෙළෙඳාමට හා සූරාකෑමට ගියෝ ය. කඩුව දේශපාලන බලයත් බයිබලය සංස්කෘතික ආධිපත්‍යයත් නියෝජනය කෙළේ ය. වෙළෙඳාම ආර්ථිකය හා සම්බන්ධ විය. බටහිර යටත්විජිතවාදය වෙනත් යටත්විජිතවාද මෙන් නොව කොටස් තුනකින් යුක්ත වෙයි. ඒ ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික යනුවෙනි.

© Prof. Nalin De Silva

ස්පාඤ්ඤදයෝ ද පෘතුගීසීහු ද කතෝලිකයෝ වූහ. එකල බටහිර යුරෝපයේ තිබුණේ මධ්‍යකාලීන කතෝලික චින්තනයකි. එහෙත් එකල තවත් දෙයක් සිදුවෙමින් පැවතුණි. බටහිර යුරෝපය පිරිවසා කතෝලික චින්තනය අභිබවා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පැන නැගෙමින් තිබුණි. එයට ආරම්භයේ දී ම සහභාගි වූවෝ කතෝලිකයෝ වූහ. එය එසේ ම විය යුතුව තිබුණි. කතෝලිකයන්ගෙන් ඇතැමෙක් අවිඥානිකව කතෝලික චින්තනයට එරෙහි ව යන යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය ගොඩනැගීමට දායක වූහ. පෘතුගීසිහු හා ස්පාඤ්ඤදයෝ ද නව චින්තනයෝ පෙර ගමන්කරුවෝ වූහ.

ලංකාවට පැමිණි පෘතුගීසිහු ද පසුව පැමිණි ලන්දේසිහු ද ඉංගිරිසිහු ද මෙරට ක්‍රිස්තියානි සංස්කෘතික ආර්ථික හා දේශපාලනික යටත්විජිතවාදයක් බිහිකළහ. සිංහලයෝ 1505 සිට ම මේ යටත්විජිතවාදයට එරෙහිව අරගල කළහ. 1505 පෘතුගීසීන් පැමිණීම සැමරීමට අදහස් කරන්නෝ ඒ යටත්විජිතවාදයෙහි ඒජංතයෝ වෙති. ඔවුහු අසවේදූගේ මුණුබුරාලා හා මිණිබිරියෝ වෙති. ඔවුන්ට ඒ සඳහා කිසිම ඉඩක් දිය යුතු නොවේ. 1815 දී බ්‍රිතානීහු මුළු රටේ ම ක්‍රිස්තියානි රාජ්‍යයක් පිහිටු වූහ. එදා මෙරට අවුරුදු දෙදහස් දෙසියක් පමණ තිබූ සිංහල බෞද්ධ රාජ්‍යය අහෝසි විය. අප නැවත නිදහස ලබාගැනීම යනු අන් කිසිවක් නොව නැවත ඒ සිංහල බෞද්ධ රාජ්‍යය පිහිටුවීම ය. සිංහල බෞද්ධ රාජ්‍යයක සිංහල බෞද්ධ නොවන්නන්ට අසාධාරණයක් වනු ඇතැයි අසවේදූගේ මුණුබුරාලා ද මිණිබිරියෝ ද කියති. සිංහල බෞද්ධ රාජ්‍යයක තරම් අන් අයට නිදහසේ ජීවත්විය හැකි තවත් රාජ්‍යයක් නැත. ඒ ගැන අපි වෙන දවසක කතා කරමු. එහෙත් අද එක් ප්‍රශ්නයක් ඇසිය යුතු වෙයි. අද අප ජීවත්වන්නේ ක්‍රිස්තියානි රාජ්‍යයක ය. මේ රටේ නීතිය වූ රෝම ලන්දේසි නීතිය බෞද්ධ නීතියක් යැයි අසවේදූගේ මිණිබිරියකට වුව ද කිව හැකි නොවේ. මේ රටේ විශ්ව විද්‍යාල හා පාසල් බෞද්ධ යැයි කිව නොහැකි ය. මෙරට ජනමාධ්‍ය ගැන කියනුම කවරේ ද? ජනමාධ්‍යකරුවන්ගෙන් ඇතැමෙක් පිය පාර්ශ්වයෙන් අසවේදූගේ මුණුබුරාලා ද මව් පාර්ශ්වයෙන් වැලන්ටයින්ගේ මුණුබුරාලා ද වෙති. මෙරට ඇත්තේ අනාගමික රාජ්‍යයක් යැයි කියන්නේ සෘජුව හෝ වක්‍ර ව හෝ බටහිර ක්‍රිස්තියානි දේශපාලන විද්‍යාව ඉගෙන ගත් අය පමණකි. 1972 ව්‍යවස්ථාවෙන් බුද්ධාගම පෝෂණය කරන බව කීව ද බුදු සසුන අද මන්දපෝෂණයෙන් බෙලහීන කර ඇත. මේ ක්‍රිස්තියානි රාජ්‍යයේ සිංහල බෞද්ධයන්ට පහර පිට පහර දීම ගැන අසවේදූගේ මිණිබිරියන් කියන්නේ කුමක් ද?

1815න් පසුව මෙරට යටත්විජිත විරෝධී අරගලයේ ප්‍රබල අවස්ථා තුනක් වෙයි. ඒ 1817 -18  නිදහස් සටන, 1648 නිදහස් සටන හා අනගාරික ධර්මපාලතුමාගේ ව්‍යාපාරය වෙයි. පළමු අවස්ථා දෙකෙහි ම මූලික ව බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි දේශපාලන සංරචකයට එරෙහිව අරගල කෙරුණු අතර අවසාන අවස්ථාවෙහි ප්‍රධාන වශයෙන් ම සංස්කෘතික සංරචකයට අරගලයක් කෙරිණි. 1956 යනු මේ සියළු නිදහස් සටන්වල තවත් අවස්ථාවක් විය. 1948 ලැබුණු නිදහස බෙලහීන ඩොමීනියන් නිදහසක් විය. සංකේතාත්මක ව ගතහොත් එය එලිසබෙත් රැජින නමින් කළු සුද්දන්  විසින් හඳුන්වනු ලැබූ එලිසබෙත් වින්ඩ්සර් නම් කාන්තාව රැජින ලෙස පිළිගත් රාජ්‍යයක් විය. එය මෙරට කළු සුද්දන්, ලෝක තත්ත්වයට පින්සිදුවන්නට, පෙත්සම් ගසා තමන් ද සුද්දන් වැනි යැයි සුද්දන්ට ඒත්තු ගැන්වීමට උත්සාහ කර ලබාගත් නිදහසක් විය. මෙරට බහුජනතාව එය නිදහසක් නොවන බව ඉවෙන් තේරුම් ගත්හ. 1952 පමණ වන විට විශේෂයෙන් ම සිංහල බෞද්ධයෝ තමන්ට නිදහස ඉල්ලා නැවතත් උද්ඝෝෂණවල නිරත වූහ.1951 බණ්ඩාරණායක මහතා පිහිටු වූ ලිබරල් ශ්‍රී ල නි ප රූපාන්තරකරණයකට භාජනය වී සිංහලත්වයේ පක්ෂය බවට පත්විය. 1956 මහජන එක්සත් පෙරමුණ මගින් ඒ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යනු ලැබිණි.

එහෙත් අසවේදූගේ මුණුබුරාලා ප්‍රමුඛ විජාතික බලවේග එදා සිට ම පණස්හයේ ජයග්‍රහණයට එරෙහි ව කටයුතු කළහ. 1956 න් පසු සිංහල බෞද්ධයන් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට එරෙහිව දිනාගත් අංශු මාත්‍රයක ජයග්‍රහණ පවා ජාතිවාදී ආගම්වාදී ක්‍රියා ලෙස හැඳින්විණි. එසේ හැඳින්වීම යටත්විජිතවාදයේ අවශ්‍යතාවයක් විය. එමගින් විජාතික බලවේග තම ජනතා විරෝධී වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළහ. ලන්දේසීන් විසින් ඇතිකරනු ලැබ ඉංගිරිසින් විසින් බෞතීස්ම කරනු ලැබූ දෙමළ ජාතිවාදය 1947 දී ක්‍රිස්තියානි මතවාදී නායකත්වයක් යටතට පත්කෙරී තිබුණි. 1956න් පසුව එය සිංහලයන්ට විරුද්ධව ඉතා තදින් යොදා ගනු ලැබුණි. 1962 ක්‍රිස්තියානි හමුදා හා පොලිස් නිලධාරීහු සිරිමාවෝ බණ්ඩාරණායක මහත්මියගේ රජයට විරුද්ධව කුමන්ත්‍රණය කළහ. කුමන්ත්‍රණකරවෝ එලිසබෙත් මහත්මියගේ අධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර නිදහස ලබාගත්හ.

© Prof. Nalin De Silva

සිංහල බෞද්ධයන්ට නාමික ව හෝ ජයග්‍රහණ කිහිපයක් අත්පත් කර ගැනීමට ලැබුණේ 1956 සිට 1972 පමණ වන තෙක් වූ සුළු කාල පරිච්ඡේදයක් තුළ පමණ ය. 1977 න් පසුව ඒ ජයග්‍රහණ ද කණපිට හරවනු ලැබිණි. අද නැවතත් ඒ ලැබූ ජයග්‍රහණ අත්පත් කරගැනීම පමණක් නොව බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආර්ථික දේශපාලනික යටත්විජිතවදයෙන් මුළුමනින් ම නිදහස්වීමේ න්‍යාය පත්‍රය ද පණස්හයේ දරුවන් අබියස ඇත. පසුගිය විසිවැනි දා අත්සන් කළ පංච මහා ප්‍රතිපත්ති සඳහන් ගිවිසුමෙහි ඇති වගන්ති කුමක් වුව ද එහි න්‍යාය පත්‍රය 1505 ඇරඹි ගමන් මග ආපසු හැරවීම ය. ඉන් කියැවෙන්නේ බරකරත්තයෙන් ආපසු අනුරාධපුරයට යෑම නොවේ. ඒ කොළඹ විශ්ව විද්‍යාලයෙහි එකල තිබූ ස්වාධීන ශිෂ්‍ය සංගමය ද අසවේදූගේ මුණුබුරන් හා මිණිබිරියන් ද ප්‍රශ්නය දකින ආකාරය වෙයි. මොවුන්ගේ කන් කෙඳිරිගෑම්වලට වැලන්ටයින්ගේ මාධ්‍යවල ඉඩ ලැබුණ ද අප ඒ ගැන එතරම් සැලකිලිමත් විය යුතු නොවේ. අපි සිංහල බෞද්ධ ක්වොන්ටම් තාක්ෂණයක් මගින් ලෝකය සමග සහජීවනයෙන් වෙසෙමු. වැලන්ටයින්ගේ මිණිබිරියන් දන්නා සිංහල බෞද්ධ ක්වොන්ටම්වාදයක් තබා බටහිර ක්‍රිස්තියානි ක්වොන්ටම්වාදයක්වත් නැත. ඔවුන් දන්නේ කසිකබල් බටහිර සමජයීය විද්‍යා මතවාද පමණකි.

ඉහත සඳහන් න්‍යාය පත්‍රය සුළුපටු වුවක් නොවේ. පසුගිය විසිවැනි දා බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවට රැස්වූවන්ට ඒ සාක්ෂාත් කරගත හැකි ද? මම එහි දී එසේ සාක්ෂාත් කරගත හැකි අය ඉතා අඩුවෙන් දුටුවෙමි. මා වැඩි වශයෙන් දුටුවේ අනාගත ඇමතිවරු, මන්ත්‍රීවරු, සංස්ථා සභාපතිවරු, උපකුලපතිවරු, තානාපතිවරු ආදී පිරිස් ය. සිංහල රට ගැන ගීත ගැයීම ප්‍රතික්ෂේප කරන ගායක ගායිකාවෝ ද, ඒ දර්ශනයෙහි ම සිටින ගීත රචකයෝ ද, සිංහල බෞද්ධ විරෝධී චිත්‍රපට් අධ්‍යක්ෂණය කරන්නෝ ද මම එහි සිටියෝ ය. බටහිර සංගීත ආර කොපි කරමින් සිංහල කටහඬින් නොව බටහිර යුරෝපීය කටහඬවල්වලින් ගයන්නන්ට ද සවන් දුන්නෙමි. මගේ සංගීතඥානය බොහෝ දෙනකුට ප්‍රශ්නයක් වීමට ඉඩ ඇත. එහෙත් බටහිර සංගීතයට ද පදනම් වූ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ගැන මෙන් ම ඒ චින්තනය විසින් බිහිකරනු ලැබූ අග්‍රඵලය වන බටහිර ගණිතය හා බටහිර භෞතික විද්‍යාව ගැන ද මම දන්නෙමි. ඉහත සඳහන් අයට ඇති සිංහල බෞද්ධ චින්තනයක් නැත. ඔවුන් සමග නම් ඒ න්‍යාය පත්‍රය සාක්ෂාත් කරගත හැකි නොවේ. ඉතා පැහැදිලිව ම සමහරුනට මේ සන්ධානය ඡන්ද සන්ධානයක් පමණකි. ඉතා ඉහළ ම අය ද ඇතුළුව ඇතැමුන් සන්ධානයට එකතුවන්නේ ද ඡන්දය බලාගෙන මිස විමුක්තියක් අත්පත් කරගැනීමට නොවේ.

සන්ධාන බිහිවෙයි. සන්ධාන කැඩෙයි. එය ලෝක ස්වභාවයයි. සිංහල බෞද්ධයෝ ඒ බව දනිති. එහෙත් මේ ඇති කරගත් සන්ධානය වැදගත් පියවරකි. පණස්හයේ දරුවන්ට දිනාගැනීමට බොහෝ දේ ඇත. ඒ සියල්ල මේ සන්ධානය ඔස්සේ දිනාගැනීමට හැකිවේයැයි සිහි බුද්ධිය ඇති කිසිවකු නොකියනු ඇත. මෙරට සිංහල බෞද්ධ පදනම ගැන ප්‍රසිද්ධියේ කීමට සන්ධානයට තවම නොහැකි ය. එහෙත් කවදා හෝ එය කිව යුතුවෙයි. සිංහල බෞද්ධයනට ද අන් අයට ද බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙන් නිදහස් විය හැක්කේ ඒ බව පණස්හයේ දරුවන්ගේ නිල ප්‍රකාශවල සඳහන් වීමෙන් අනතුරුව ය. ශ්‍රී ල නි ප තවමත් මහජන පක්ෂයෙන් පාලනය වෙයි. මහජන පක්ෂය යනු පණස්හයට එරෙහිව පිහිටුවා ගන්නා ලද පක්ෂයකි. ඒ බව තේරුම් ගත් ඉලංගරත්න මහතා වැන්නෝ වැඩිකල් නොගොස් ම ඒ පක්ෂයෙන් ඉල්ලා අස්වූහ. ශ්‍රී ල නි ප, මහජන පක්ෂයෙන් මුළුමනින් ම නිදහස් විය යුතු ය. ජ වි පෙ මාක්ස්වාදයේ සිට දිග ගමනක් පැමිණ ඇත. එහෙත් එයට යාමට තව දුරක් වෙයි.

අවුරුදු හතළිහකට පෙර ගුණදාස අමරසේකර මහතා මෙරට අනාගතය උගත් ගැමි තරුණ පරපුරට හිමිවිය යුතු යැයි ප්‍රකාශ කෙළේ ය. එවකට ජ වි පෙ නමින් දේශපාලන පක්ෂයක් නොවී ය. එමෙන් ම ජාතික චින්තනයක් පිළිබඳ හාන්කවිසියක්වත් නොතිබිණි. අමරසේකර මහතා ඒ ප්‍රකාශය කෙළේ නිදහස් අධ්‍යාපනය ඔස්සේ මධ්‍ය මහා විද්‍යාලවලින් බිහි වූ ගැමි උගතුන් ගැන සිතමින් විය යුතු ය. එහෙත් මධ්‍යම මහා විද්‍යාලවලින් මෙන් ම බෞද්ධ විද්‍යාලවලින් ද ලැබෙන්නේ බටහිර අධ්‍යාපනයකි. එය ක්‍රිස්තියානි අධ්‍යාපනයකි. මේ අධ්‍යාපනය ගැන මගේ දේශනයෙහි දී ද සඳහන් විය. මේ අධ්‍යාපනයෙන් බිහිවන්නන්ට මාක්ස්වාදය හෝ ලිබරල්වාදය හෝ මගින් ලබාගත හැකි නිදහසක් ඇතැයි මම නොසිතමි.

© Prof. Nalin De Silva